# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,301 — 1962 සැප්තැම්බර් 14 වැනි සිකුරාද — 1962.9.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1319 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1319 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1321 |
| රෙජිස්ට්‍රාර්වරුන් ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1321 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1322 |
| " සුරාබද්ද ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | 1323 |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 384**

අංකය : ඩී. 22/රෙක්ට/43.

### රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

1962 ඔක්තෝම්බර් මස 31 වැනි දින සිට, රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය හමුදාවෙන් වැඩබලන ලයිතන් (ඊ) කේ. ඈන්. වැන් කියුලැන් බර්ග් විශ්‍රාම ගනී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඈන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 31 වෙනි දා,
කොළඹ දී ය.

9-417

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 385**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඑ්. 11/48.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1962 සැප්තැම්බර් මස 5 වැනි දින සිට කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 50557, ඉසෙඩ් 867, 45651, 8030, 46048, 47911, 50091 සහ 47419 දරණ නඩු අසා අවසාන කිරීමට සහ තීන්දුදීමට, කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑ්. 25/46.

වී. එම්. කුමාරස්වාමි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1962 සැප්තැම්බර් මස 8 වැනි දින සිට යාපනේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 23064, 23897, 24127, 23761, 24396

## විශෙෂ නිවේදනයයි

1962 සැප්තැම්බර් මස 26 වෙනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1962 සැප්තැම්බර් 28 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 සැප්තැම්බර් 22 වැනි සෙනසුරාදා දවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 සැප්තැම්බර් 14 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

අංකය : පීඑල්/ඩී. 9/61.

එම්. ඒ. සී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. වික්‍රමතුංග මහතා 1962 සැප්තැම්බර් මස 7 වැනි දින මාතර දිස්ත්‍රික්කයේ කඳබොඩ පත්තුවේ සහ ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා වැල්ලබොඩ පත්තුවේ සහ කඩවත් සතරේ අතිරේක ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 5/56.

එස්. ඒ. යටවර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. බී. එම්. සී. බණ්ඩාර මහතා 1962 සැප්තැම්බර් මස 6 වෙනි දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර සහ බටහිර නුවර ගම් පලාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද. එස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 සැප්තැම්බර් මස 6 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

9-421

---

# වෙනත් පත්කිරීම් ආදිය

## 1962 අංක 386

අංකය : ජේ 14/62.

1944 අංක. 13 දරණ ආඥාපනතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9,828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරණ ප්‍රකාශනයෙන් සංශෝධිත 1939 අංක 48 දරණ ළමයින් සහ තරුණ අය පිළිබඳ ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින් 1962 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට, මොහමඩ් හුසේන් මහතා, එම මහතාගේ අනිකුත් රාජකාරිවලට අතිරේක වශයෙන්, කළුතර අධිකරණ කොට්ඨාශයෙහි ළමා මහේස්ත්‍රාත්වරයා ලෙස පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 6 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

9-430

---

## 1962 අංක 387

අංකය : ඒ. ජේ. 28/3/58.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින් :—

1. ඊ. පී. ද සිල්වා මහතා ගාලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
2. බී. ඩබ්ලිව්. මඩම මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
3. ජී. ඊ. අර්ථනායක මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
4. හී. මුනි සිරිසේන මහතා කෑගලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
5. පී. බී. බුලත්කුලම මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද

පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 10 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-497

---

## 1962 අංක 388

මුස්ලිම් විවාහ සහ දික්කසාද ආඥාපණතේ (115 වැනි පරිච්ඡේදයේ) 12(1) වැනි වගන්තිය යටතේ කම්කරු, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1962 සැප්තැම්බර් මස 1 දින සිට 1962 දෙසැම්බර් මස 31 දින දක්වා බදුල්ල දිස්ත්‍රික්කයේ ක්වාසි ධුරයට බදුල්ලේ පදිංචි නාගුර් මීරා මොහම්මඩ් සියාඩ් මහතා පත් කරන්ට යෙදුනා ඇත.

වී. එල්. වීරසිංහ,
කම්කරු, සුවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 30 දින,
කොළඹ දීය.

9-297

---

## 1962 අංක 389

ගජසිංහ ආරච්චිගේ ජර්මේන් ඇල්ෆ්‍රඩ් ද සිල්වා මහතා මීගමුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කම්කරු, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කම්කරු, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

9-346

---

# ආණ්ඩුවේ නිවේදන

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ මෙහි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කෑගලු දිස්ත්‍රික්කයේ පරණ කුරු කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි නැගෙණහිර සහ බටහිර තුන්පළාතපත්තු ගම්ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත්කරමි :—

(1) හකුරුගම්මන පදිංචි ජී. බී. රත්නායක.
(2) තඹවිට-හරන්කහව පදිංචි කේ. ආර්. බී. තඹවිට.
(3) මෝරාගම්මන පදිංචි අසරප්පුලිගෙදර චාලි.
(4) මෝරාගම්මන පදිංචි ෂරීප් අබුබකර් මොහමඩ් ෂරීප් උඩයාර්.
(5) අරණායක පදිංචි දතුගෙදර පියසේන.
(6) අරම, කහටගස්පිටිය පදිංචි පතන්ගතැන්නේ වෙදලාගේ අර්නෝලිස්.
(7) අම්බලකන්ද පදිංචි විජේසේකරගේ සිරිසේන දිසානායක.
(8) අම්බලකන්ද පදිංචි විජේසේකරගේ පේමරත්න.
(9) දෙයියන්වෙල පදිංචි රාජපක්ෂගේ හරිපාල සමරසිංහ.
(10) හෙම්මාතගම වේරගොඩ පදිංචි ලොකුගේ චාර්ලිස් අප්පුහාමි.
(11) නැගෙණහිර අරණායක පදිංචි ගල්බඩ දේවගේ සරත් ආරියරත්න.
(12) වේරකෝ-කුඹල්ගම පදිංචි පහල රාල්ලාගේ සමරසිංහ බණ්ඩා.
(13) දුම්බුළුවාව පදිංචි යූ. එල්. එම්. ෂරීප්.
(14) වාඩියතැන්න-කොටේගොඩ පදිංචි ඇස්සදුමේ ගුරුන්නැහැලාගේ මුහම්මදු යූසුප් මුහම්මදු සාලි.
(15) දුම්බුළුවාවේ පදිංචි මාවෙල රාල්ලාගේ පිඤ්ඤිබණ්ඩා.
(16) මඩුල්බෝව පදිංචි මුහම්මදු හනීපා ලෙබ්බේ පාදිලියාර් මුහම්මදු සකරියා ආලිම්.
(17) දෙබත්ගම පදිංචි සමරසිංහගේ ජස්ටින් සමරසිංහ

(18) කුඹල්ගම පදිංචි හලාවත් මුදියන්සේලාගේ සැදිබණ්ඩා ඔව්ටිගම.

(19) කෙහෙල්පත්නල පදිංචි රණසිංහ මුදියන්සේලාගේ පුංචිබණ්ඩා.

(20) රහල පදිංචි නන්දමුණි ආරච්චිල්ලැ පීරිස් ගුණරත්න.

(21) හත්ගම්පල පදිංචි මීගහමූල හේන පුංචිඅප්පුහාමි.

(22) මෙතම පදිංචි මහආරච්චිල්ලාගේ කිරිබණ්ඩා.

(23) කෙහෙල්පත්නල පදිංචි පෙරමුනිරාලලාගේ මුදියන්සේ අමරකෝන්.

(24) ගෝනවල පදිංචි ගෝනවල රාලලාගේ ජයතිලක.

(25) බලවත්ගම පදිංචි හේරත් මුදියන්සේලාගේ පුංචිතිලමේ.

(26) තිකපිටිය පදිංචි ජී. ටී. අබේකෝන්.

(27) ඉද්දවල පදිංචි ජී. ඒ. ලේකම්ගේ.

(28) අළුදෙනිය පදිංචි එම්. එම්. චන්ද්‍රසේන.

(29) මීපිටිය පදිංචි එල්. පෙතලියාගොඩ.

(30) අඹකුඹුර පදිංචි එච්. ඒ. රයිසා.

(31) කෙහෙල්පත්නල පදිංචි ඒ.ජී. මද්දුම බණ්ඩා.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් හකුරු ගම්මන පදිංචි ජී. බී. රත්නායක මහතා පත්කරමි.

තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු 2 ක් විය යුතුයයි නිශ්චය කරමි.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962 සැප්තැම්බර් මස 6 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-498

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### 3 (2) වෙනි වගන්තිය යටතේ කරණලද දැන්වීමයි.

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වෙනි වගන්තියේ 2 වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව, අධිකරණ ඇමති තැන්පත්, සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙහි ඇති උපලේඛනයේ සඳහන් එක් එක් ගම් ප්‍රදේශයක් සඳහා සමගිදායකයින්ගේ සභාවක් බැගින් පිහිටුවීමට අදහස් කර ඇති බව සහ ඒ ගම්ප්‍රදේශයේ ගම්කායසී සභාවද, ඒ ගම්ප්‍රදේශයේ සෑම ග්‍රාම සංවර්ධන සමිතියක් හා සෑම ප්‍රජාමණ්ඩලයක් ද, සමූපකාර සමිති ආඥාපනත යටතේ ලියා පදිංචි කරනු ලැබූ ඒ ගම් ප්‍රදේශයේ සෑම සමූපකාර සමිතියක් ද විසින්, නිර්දේශ මණ්ඩලයේ මතය පරිදි, ඒ සභාවේ සමාජිකයන් වීමට සුදුසු තැනැත්තන්, 1962 ඔක්තෝබර් මස 5 වෙනි දින හෝ ඊට පළමු, මා වෙත නිර්දේශ කළහැකි බව, මෙයින් දන්වමි.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1962 සැප්තැම්බර් මස 6 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

1. කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි උතුරු සහ දකුණු කඳුපිටපත්තු ගම්ප්‍රදේශය.

2. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි මාහෝ ගම්ප්‍රදේශය.

3. මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි බටහිර ගම්පහ (උඩදුම්බර) ගම්ප්‍රදේශය.

4. මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව සහ කඩවත් සතරේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි දෙවිනුවර ගම්ප්‍රදේශය.

5. මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව සහ කඩවත් සතරේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි දික්වැල්ල ගම්ප්‍රදේශය.

6. මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි දෙනියාය ගම්ප්‍රදේශය.

7. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි තිස්සමහාරාම ගම්ප්‍රදේශය.

8. හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි වලස්මුල්ල ගම්ප්‍රදේශය.

9-496

---

ඇල්. ඞී.—බී. 26/61.

## 1961 අංක 31 දරන ආයුර්වේද පනත

### ආඥාව

1961 අංක 31 දරන ආයුර්වේද පනතෙහි 1 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සෞඛ්‍ය ඇමති, ඇලෙක් සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, 1961 අංක 31 දරන ආයුර්වේද පනත වලංගු විය යුතු දිනය වශයෙන් 1962 ඔක්තෝබර් මස 1 වෙනි දිනය මේ ආඥාවෙන් නියම කරමි.

ඒ. පී. ජයසූරිය,
සෞඛ්‍ය ඇමති.

1962 සැප්තැම්බර් 1 වෙනි දින,
කොළඹ දී ය.

9-423

---

ඇල්. ඞී.—බී. 79/49.

## ආහාර හා ඖෂධ පනත

(216 අධිකාරය වන) ආහාර හා ඖෂධ පනතේ 41(3) වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ඇමතිතුමා විසින් කරන ලද ආඥාව යි.

ඒ. පී. ජයසූරිය,
සෞඛ්‍ය ඇමති.

1962 කොළඹ දීය.

### ආඥාව

මේ ආඥාව බලපවත්වන මුළු කාලය පුරා රජයේ රස පරීක්ෂක තැන මාතර නගරයේ පරිපාලන ප්‍රදේශය සඳහා අනුමත කරන ලද රජයේ රස පරීක්ෂකයකු වන බැව් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

9-422

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ප්‍ර කා ශ න ය යි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය හත්පත්තුව ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ ගිනිගත්පිටිය ගම්පති කොට්ඨාශයේ වැරැල්ලගහ වත්තේ ගවයින් අතර " මුව සහ කුර " නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : මොල්ලිගොඩ කරත්ත පාර.
දකුණට : කුලියාපිටිය ප්‍රධාන මාවත.
නැගෙනහිරට : කඩහපොල-කටුපොත පාර.
බස්නාහිරට : කටුගම්පොල හත්පත්තුවේ මායිම.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද " සතුන්ගේ බෝවෙන රෝග " පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නිත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පොල්ගහවෙල පශු වෛද්‍ය තැනගෙන්

හෝ දඹදෙණිය හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඍාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශකය අද දින පටන් වලංගු වන බව දත යුතු සි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන.

1962 සැප්තැම්බර් 6 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කායඍාලයේ දී ය.

9-401/1

---

## ප්‍ර කා ශ න ය යි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය හත්පත්තුව ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ ගිනිගත්පිටිය ගම්පති කොට්ඨාශයේ වැරැල්ලගහ වත්තේ සහ ජින්සල්ගන්ගොඩ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : නුග ගහ ගෙදර ගම.

දකුණට : කුඹුරගොඩුව කරත්ත පාර.

නැගෙනහිරට : කඩහපොල කුඹුරු.

බස්නාහිරට : කඩහපොල-කටුපොත මාවත.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පොල්ගහවෙල පශු වෛද්‍ය තැනගෙන් හෝ දඹදෙණිය හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කායඍාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු සි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන.

1962 සැප්තැම්බර් 6 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කායඍාලයේ දී ය.

9-401/2

## පානදුරේ වලපොලපට්ටිය අරක්කු තැබෑරුම වැසීම පිළිබඳ ඡන්ද විමසීම

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර නගර සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ වලපොලපට්ටියේ පිහිටි අරක්කු තැබෑරුම වැසීම පිළිබඳව ඡන්ද විමසීම සම්බන්ධව මූලික නාම ලේඛන මහජනයාට බලාගැනීම සඳහා 1962 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා පානදුරේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කාර්යාලයේ සහ කළුතර කච්චේරියේ තබා තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. ඉහත සඳහන් තැබෑරුම සඳහා ඡන්ද කොට්ඨාශ පහත සඳහන් පරිදිවේ.

| තැබෑරුම | ඡන්ද කොට්ඨාශය |
|---|---|
| පානදුර නගර සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ වලපොලපට්ටියේ පිහිටි අංක 4 දරණ අරක්කු තැබෑරුම. | පානදුර නගර සභාවේ අංක 6 සහ 7 දරණ කොට්ඨාශ. |

ඉහත සඳහන් ලේඛනවලට නම් ඇතුලත් කිරීම සඳහා අයිතිවාසිකම් හෝ ලියාපදිංචිවී තිබෙන නම්වලට විරුද්ධතාවයන් ඉදිරිපත් කිරීම 1962 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා භාරගනු ලබේ.

වී. පතිරණ,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1962 සැප්තැම්බර් මස 3 වැනි දින,
කළුතර කච්චේරියේ දීය.

9-292

---

## "සුරාබදු ආඥපනත" පිළිබඳ දැන්වීම්

සු. කො. එල් සී/ඊ/252 ඒ.
එල්.ඩී—බී 18/44.

### සුරාබදු ආඥාපනත

#### අංක 506 දරණ සුරාබදු නිවේදනය

1961 අංක 49 දරණ පනතින් සංශෝධිත (52 වෙනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 25 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින්, 1944 සැප්තැම්බර් මස 15 වෙනි දින හා අංක 9,311 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අංක 386 දරණ සුරාබදු නිවේදනය, එහි උපලේඛනයෙහි 6 වෙනි කොන්දේසියට ඉක්බිති ව මී පහත සඳහන් වචන, එනම් :—

"එසේ වුවද ඕඩි කොලොං නමැති ඖෂධ නිෂ්පාදනය සම්බන්ධයෙන්, අල්ලන ප්‍රමාණය ද්‍රව අවුන්ස එකකට අඩු නොවූ බෝතලවල හෝ වෙනත් භාජනවල එය විකිණීමට සුරාබදු කොමසාරිස් විසින් බලය දිය හැකි ය."

යන්න එකතු කිරීමෙන් සංශෝධනය කළ යුතු යයි, නියම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 අගෝස්තු මස 11 වෙනි දින,
කොළඹ දී ය.

9-327

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි